SINHALESE

Court Network



# ඔබේ දිනයක් අධිකරණයේ

## A Guide

Family Violence Intervention Orders in the Magistrates' Court

# ඔබේ ආරක්ෂාව පිලිබඳ හදිසි ගැටලු ඇත්නම්, ආරක්ෂාව උදෙසා 000 අමතන්න

**ගෘහස්ථ හිංසනය:** බිය කිරීමෙන් හෝ බලහත්කාරයෙන් පවුලේ සාමාජිකයෙකු පාලනය කිරීමට, තර්ජනය කිරීමට, බල කිරීමට හෝ ආධිපත්‍යය පැතිරවීමට භාවිත කරන හානිකර හැසිරීම. එය ඔබට නොසිතන සංකීර්ණ ආකාරවලින් සිදුවිය හැකි අතර, සම්පූර්ණ අර්ථ දැක්වීම සහ උදාහරණ සඳහා www.vic.gov.au/what-family-violence බලන්න


**ගෘහස්ථ හිංසනයට මැදිහත්වීමේ නියෝගය (FVIO or IVO):** පුද්ගලයෙකු, ඔවුන්ගේ දරුවන් සහ ඔවුන්ගේ දේපළ පවුලේ සාමාජිකයෙකුගෙන්, හවුල්කරුවෙකුගෙන් හෝ හිටපු සහකරුවෙකුගෙන් ආරක්ෂා කිරීමට අධිකරණ නියෝගයක්.

**අයදුම්කරු:** අධිකරණ නියෝගය ඉල්ලා සිටින පුද්ගලයා. බොහෝ අවස්ථාවල පොලීසිය හෝ ගෘහස්ථ හිංසනයට ලක්වූ පුද්ගලයා/ එයින් මිදුණු පුද්ගලයා.

**ආරක්ෂා කළ පුද්ගලයා:** මැදිහත්වීමේ නියෝගය යටතේ ආරක්ෂා කර ඇති පුද්ගලයා. මොහු පැමිණිලිකරු සහ ඔවුන්ගේ දරුවන් විය හැකි ය.

**වගඋත්තරකරු:** ගෘහස්ථ හිංසහනය සිදුකළ බවට චෝදනා එල්ල වූ පුද්ගලයා.

**නඩු විභාගය:** අධිකරණය තුළ නඩුව ඉදිරිපත් කිරීම.



# පවුල් හිංසනයට මැදිහත්වීමේ නියෝග (FVIO)

FVIO යනු නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අධිකරණ නියෝගයක් වන අතර එය පුද්ගලයෙකුට, ඔවුන්ගේ දරුවන්ට සහ ඔවුන්ගේ දේපළවලට ආරක්ෂාව සැපයීම අරමුණු කරයි. මෙම නියෝගය අධිකරණයේ මහේස්ත්‍රාත්වරයෙකු විසින් සිදු කරනු ලැබේ.

වගඋත්තරකරු ආරක්ෂිත පුද්ගලයාට එරෙහිව පවුල් ප්‍රචණ්ඩත්වය භාවිත කිරීම නැවැත්වීමට මෙම නියෝගයේ කොන්දේසි ඇත.

තත්ත්වයන්වලට අනුව, FVIO ඔස්සේ වගඋත්තරකරුට මේවා නියෝගකළ හැකි ය:

- හැසිරීම නැවැත්වීම
- ආරක්ෂිත පුද්ගලයා සම්බන්ධ කර නොගැනීම හෝ සන්නිවේදනය නොකිරීම හෝ ඔවුන් වෙනුවෙන් එය කිරීමට වෙනත් කෙනෙකු අනියුක්ත කිරීම
- ආරක්ෂිත පුද්ගලයා සිටින ස්ථානවලට නොයාම හෝ ආසන්නයේ සිටීම හෝ ඔවුන් වෙනුවෙන් එය කිරීමට වෙනත් කෙනෙකු අනුයුක්ත කිරීම.

FVIO සිවිල් ගැටලුවකි. වගඋත්තරකරු කොන්දේසි කඩකරන්නේ නම්, එය පොලීසියට දන්වන්න. කොන්දේසි කඩකිරීම අපරාධයකි.

# FVIO සඳහා අයදුම්කිරීම

ඔබ ගෘහස්ථ හිංසනයට ලක්වූ වින්දිතයෙක් නම්, ඔබට අන්තර්ජාලය හරහා FVIO සඳහා අයදුම්කිරීම හෝ වැඩිදුර තොරතුරු සඳහා මෙම සබැඳිය භාවිත කළ හැක: **www.mcv.vic.gov.au/intervention-orders**

ඇතැම් අවස්ථාවල, පොලීසියට ඔබ වෙනුවෙන් අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි ය.

# ඔබේ FVIO නඩු විභාගය සඳහා අධිකරණයට සහභාගීවීම

**ඔබ වෙනුවෙන් පොලීසිය FVIO අයදුම් කරන්නේ නම්, ඔබට අධිකරණයට සහභාගී විය යුතු ද යන්න ඔවුන්ගෙන් විමසන්න.**

## ආරක්ෂාව පිළිබඳ ගැටලු

- ඔබට ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇත්නම්, අධිකරණ දිනයට පෙර අධිකරණයට ඇමතුමක් ලබාදෙන්න. ඔවුන්ට ඔබට ආරක්ෂිතව ඇතුල්වීමට හා රැඳීසිටීමේ කාමර ලබාදීමට හැකියාවක් තිබිය හැක.

## ඔබට කථන භාෂා පරිවර්තකයෙක් අවශ්‍ය නම්

- ඔබට අධිකරණයේදී සහාය වීමට කථන භාෂාපරිවර්තකයෙක් අවශ්‍ය නම්, අධිකරණ දිනයට පෙර අධිකරණයට කතාකරන්න, ඔබට නොමිලේ පරිවර්තන සේවාව ලබාගැනීමට හැකිවනු ඇත.
- ඔබට කථන භාෂා පරිවර්තකයෙකු අවශ්‍ය නම්, ඔබ කථන භාෂා පරිවර්තකයෙකු භාවිතා කිරීම වැදගත් ය. ඔබ අධිකරණයේ සිදුවන දේ තේරුම්ගැනීම වැදගත් ය.
- ඔබ කථන භාෂා පරිවර්තකයෙකු වෙන්කර ඇත්නම්, ඔබේ නඩු විමසීම පරිවර්තකයා නොමැතිව සිදු නොවනු ඇත. කථන භාෂාපරිවර්තකයෙකු වෙන්කරවා ගෙන ඇත්දැයි ඔබට විශ්වාස නැත්නම් ලියාපදිංචි වන ස්ථානයෙන් පරීක්ෂා කරන්න.

## අධිකරණයේ කටයුතුවලට සම්පූර්ණ දිනයම ගතවීමට හැකිය

- ඔබ අධිකරණයේ පැය කිහිපයක් හෝ සම්පූර්ණ දිනයම සිටීමට ඉඩ ඇති හෙයින් ඔබේ අධිකරණ දිනයේ වෙනත් කටයුතු සඳහා වෙන්කරගැනීමෙන් වලකින්න. ඔබ රැකබලාගන්නා ළමයින් හෝ පුද්ගලයින් සිටීනම්, එදින සඳහා ඔවුන්ව රැකබලාගැනීමට වෙනත් අයෙක් යෙදවීමට කටයුතු කරන්න.

## සහාය

- හැකිනම්, අධිකරණයට පැමිණීමේදී සහාය පුද්ගලයෙකු සමග පැමිණෙන්න. මෙම පුද්ගලයා මිතුරෙකු හෝ පවුලේ සාමාජිකයෙකු විය හැකිය. ඔබට එය සිදුකළ නොහැකිනම් හෝ අධිකරණය හා එහි කටයුතු සම්බන්ධ කටයුතු පිළිබඳ අවබෝධයක් ඇති අයෙකුගෙන් අමතර සහය ලබාගැනීමට අවශ්‍ය නම්, ඔබට **1800 571 239** ඔස්සේ **අධිකරණ ජාලය** **(Court Network)** හරහා සහාය වෙන්කරගත හැකි ය.
- ඔබට සහභාගීවීමට වෙනත් සහය අවශ්‍ය නම්, ඔබට අධිකරණයෙන් විමසීම හෝ අධිකරණ ජාලය ඔස්සේ ලබාගත හැකි සහය විමසිය හැකිය.

## ඇඳිය යුත්තේ කුමක්ද සහ රැගෙන ආ යුත්තේ මොනවාද

- ඇඳුම් පැළඳුම්: පිළිවෙල, පිරිසිදු ඇඳුම්.
- රැගෙන එන්න: කෙටි ආහාර සහ වතුර, ඔබේ ගැටලුව/ නඩුවට අදාල ලේඛන තිබේ නම් ඒවා සහ සම්පූර්ණයෙන් ආරෝපිත උපකරණ.

# අධිකරණය

## ඔබ පැමිණි පසු

- ඔබ උසාවියට පැමිණි පසු ලියාපදිංචි කිරීමේ කවුන්ටරය වෙත යන්න.
- ඔබට උසාවි නඩු විභාගයක් ඇති බව ලියාපදිංචි කිරීමේ කාර්ය මණ්ඩලයට පවසන්න, ඔබේ අධිකරණ ලේඛන ඔවුන්ට පෙන්වන්න.
- උසාවිය ඔබට භාෂා පරිවර්තකයෙකු වෙන් කර ඇත්නම්, ඔවුන් පැමිණෙන කාලය කාර්ය මණ්ඩලයෙන් විමසන්න. භාෂා පරිවර්තකයෙකු වෙන් කර නොමැති නමුත් ඔබට එවැන්නෙක් අවශ්‍ය නම්, භාෂා පරිවර්තකයෙකු සිටීදැයි කාර්ය මණ්ඩලයෙන් විමසන්න.
- ඔබට නීති උපදෙස් ලැබී නොමැති නම් සහ ඔබ වෙනුවෙන් පෙනී නොසිටින්නේ නම් (නීතිඥයෙකු හෝ පොලිසියකින්), ඔබට රාජකාරි නීතිඥවරයාට කතා කිරීමට අවශ්‍ය නම් රෙජිස්ට්‍රාර්ටහට දැනුම්දෙන්න.
- ඔබට ආරක්ෂිත ගැටලු ඇත්නම්, ලියාපදිංචි කිරීමේ ස්තානයට දැනුම්දෙන්න.

## ඔබේ නඩු අවස්ථාව වනතෙක් රැඳී සිටීම


- ඔබේ නඩුව විභාග වනතෙක් ඔබ බලා සිටින අතරතුර ඔබට වාඩිවී සිටීමට රැඳීසිටීමේ ස්ථානයක් ඇත. ඔබට පැය කිහිපයක් සිටීමට ඉඩ ඇති හෙයින් ඉවසීමෙන් රැඳීසිටින්න.
- ඔබට කිසියම් හේතුවකට අධිකරණයෙන් පිටවීමට අවශ්‍ය නම්, ඔබේ විභාගය මඟ නොහැරෙන බව තහවුරු කිරීමට කරුණාකර ලියාපදිංචි ස්ථානයට දන්වන්න.
- භාෂා පරිවර්තකයෙකු වෙන්කර ඇත්නම්, පරිවර්තකයා පැමිණෙනතුරු ඔබේ විභාගය සිදුනොවනු ඇත.
- ඔබේ විභාගයට සූදානම් විට, ඔබව අධිකරණයට කැඳවනු ඇත.

# අධිකරණ කාමරය

- ඔබේ නඩුව කැඳවූ විට, අධිකරණ කාමරයට යන්න.
- ඔබේ දුරකථනය නාද නොවන ලෙස සකසන්න.
- ඇතුල්වීමේදී සහ පිටවීමේදී මහේස්ත්‍රාත්වරයාට හිස නමන්න.
- මහේස්ත්‍රාත්වරයා ඔබෙන්, ඔබේ නීතිඥවරයාගෙන් හෝ පොලී සියෙන් ඔබේ නඩුවේ සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව ප්‍රශ්න කිහිපයක් ඇසීමට ඉඩ ඇත.
- මහේස්ත්‍රාත්වරයාට වගඋත්තරකරුගෙන් සහ/හෝ ඔවුන්ගේ නීතිඥයාගෙන්ද ඇසීමට ඉඩ ඇත.
- ඔවුන් නඩුවේ තොරතුරු දැනගත් පසු, සිදු කළ යුතු දේ පිළිබඳව මහේස්ත්‍රාත්වරයා තීරණය කරනු ඇත. ඔබට නැවත අධිකරණයට පැමිණීමට සිදුවිය හැකි අතර, නැතහොත් එම දිනය තුළ දීම නඩුව අවසන්විය හැකි ය. වගඋත්තරකරුට මැදිහත්වීමේ නියෝගයක් නිකුත් කළ හැකි ය.
- සිදුවන්නේ කුමක්ද යන්න පැහැදිලි නැතිනම් මහේස්ත්‍රාත්වරයාගෙන් හෝ පොලීසියෙන් ප්‍රශ්න ඇසීම සිදුකළ හැකි ය. "ස්වාමීනි (Your Honour)" ලෙස මහේස්ත්‍රාත්වරයා අමතන්න.

# අධිකරණයෙන් පසුව

- මහේස්ත්‍රාත්වරයා ඔබේ නඩුව අවසන් කිරීමෙන් පසු ලේඛන එකතු කිරීමට හෝ අත්සන් කිරීමට ඔබෙන් ඉල්ලා සිටිය හැක. ලියාපදිංචි කිරීමේ මේසය වෙත ගොස් ඔබට උසාවියෙන් පිටවීමට පෙර කළ යුතු යමක් තිබේදැයි බලන්න.
- ඔබට ප්‍රතිඵලය පිලිබඳ ගැටලුවක් ඇත්නම්, නීති උපදෙස් පැතීම හෝ ලියාපදිංචි ස්ථානයට කතාකිරීම සිදුකරන්න.
- ඔබේ නියෝගය වෙනස් කිරීමට හෝ දිගු කිරීමට අදහස් කරන්නේ නම්, එහි ක්‍රමවේදය මෙතැනින් බලන්න www.mcv.vic.gov.au/family-matters/family-violence-intervention-orders-fvio


මහේස්ත්‍රාත්වරයා
අධිකරණය ලිපිකරු
පොලීසිය/ පැමිණිලිකරු
වගඋත්තරකරු/ නීතිඥයා
සාක්ෂිකරු කුටිය
ආරක්ෂාකළ පුද්ගලයා
මහජන ප්‍රදේශය

Victorian Legal Services
**BOARD + COMMISSIONER**
Funded through the Legal Services Board Grants Program


අධිකරණ ජාලය
1800 571 239
www.courtnetwork.com.au
admin@courtnetwork.com.au
Lvl 5, 555 Lonsdale Street,
Melbourne, Vic, 3000


මෙය අධිකරණයේ ඔබේ දිනය සඳහා දළ මාර්ගෝපදේශයකි. අධිකරණ ක්‍රියාවලීන් වෙනස් වන විට තොරතුරු වෙනස් වීමට ඉඩ ඇත.

වෙනත් භාෂා ඇතුළුව අන්තර්ජාලය හරහා සම්පත් වෙත ප්‍රවේශය සඳහා

උසාවි ජාලය වෙත යොමු කිරීමක් කිරීමට